## අතීතයෙන්

# ලොව ම අගය කරන මී පැණි

සිංහල වෙදකමේ මී පැණිවලට හිමිවී ඇත්තේ විශේෂ ස්ථානයකි. කසාය අනුපාන සඳහා මෙන් ම කල්ක, ගුලි ආදිය පාවිච්චි කිරීමේ දී ද මී පැණි භාවිත කිරීම නිතර ම සිදුවෙයි. මී පැණිවල අගය පෙරදිග රටවල් පමණක් නොව ලොව හැම රටක් ම වාගේ ඈත අතීතයේ සිට ම හඳුනාගෙන සිටියේ ය.

ඈත අතීතයේ ග්‍රීක වැසියෝ මී පැණි ආදරයේ ආහාරය ලෙස සැලකූහ. තරහ, දුක, දෙම්නස වැනි අවස්ථාවන්හි දී සිතට සහනයක් පතා ඔවුහු මී පැණියෙන් පිළියෙළ කෙරුණු බීමක් පාවිච්චි කළහ. එම බීමේ බලයෙන් සිතට සතුටකුත් ප්‍රසන්න පෙනීමකුත් ඔවුහු ලබා ගත්හ.

ග්‍රීක ක්‍රීඩකයෝ මී පැණි වතුරට මිශ්‍රකර දිනපතා පාවිච්චියට ගත්හ. එමගින් ශරීර ශක්තියත් සෞඛ්‍යයත් රැක ගත්හ.

විවාහ උත්සව වලදී ද මී පැණිවලට විශේෂ තැනක් ලැබී තිබිණි. ඊජිප්තුවේ මනාලයකු විවාහ උත්සවයේ දී මනාලියට මී පැණි රාත්තල් තිස් දෙකක් තෑගි කළ යුතු විය. බෙංගාලයේ බ්‍රාහ්මණ වංශිකයෝ මනාලයාත් මනාලියත් වෙත මී පැණි ඉසිති. ඉන්දියාවේ සමහර පෙදෙස්වල වැසියෝ දරුවකු උපන් විට පළමුවෙන් ම කරනුයේ එම දරුවාට මී පැණි කැවීමයි. එසේ කිරීමෙන් දරුවා රෝගවලින් ආරක්ෂා වීමත් දීර්ඝායු ලැබීමත් සිදුවෙතැ යි ඔවුහු විශ්වාස කරති. මී පැණි රෝග මර්දන ශක්තිය මෙන් ම සෞඛ්‍යය රැකදීමේ ශක්තිය අතින් ද මුල් තැනක් ගන්නා වටිනා ඖෂධයක් බව වර්තමානයේ වෛද්‍ය පරීක්ෂණ මගින් හෙළිදරව් වී තිබේ.

මෑතක දී ඇමරිකාවේ ගම්බද පෙදෙසක මෝටර් රථ කාර්මිකයෙක් පැට්රල් ටැංකියක් පිපිරී ගිනි ගැනීමෙන් ඉතා දරුණු ලෙස පිළිස්සුනි. ළඟම රෝහල තිබුණේ ඇරිසෝනාවල ය. ඒ සැතපුම් 15 ක් ඈතිනි. ඔහුගේ බිරියත් මවත් දෙදෙනාට වෙලාවේ හැටියට කළ හැකි ප්‍රතිකාරයක් හා ඖෂධයක් ලෙස තිබුණේ මී පැණි බෝතලයක් පමණී. ඔවුහු වහා ම ඔහුගේ සිරුර පුරා මී පැණි ගෑවෝ ය.

රෝහල වෙත ඔහු ගෙන යන විට වේදනාව සහමුලින් ම තුරන්ව තිබිණි. තුවාල වියැළී තිබිණි. තුවාල සම්පූර්ණයෙන් ම සුව වූ විට කැළැල් කිසිවක් නොවිනි. මී පැණිවල බලයෙන් එසේ වූ බව වෛද්‍යවරු පිළිගත්හ.

මී පැණිවල ඇති ඖෂධීය ගුණය බටහිර ජාතිකයන්ගෙන් පළවු වෙන් ම සොයා ගත්තේ රෝමන්වරු ය. රෝමවරු බ්‍රිතාන්‍යය ආක්‍රමණය කළ පසු ඔවුන් මී පැණිවලට තද ඇල්මක් දැක්වූහ. සැම කෙනකු ම වාගේ මී පැණි විශාල වශයෙන් ආහාරයට ගත්හ. ඔවුහු නිරෝගීව දිගු කලක් ජීවත් වූහ. මේ නිසා ඔවුහු බ්‍රිතාන්‍යයට "මී පැණි දූපත"යැයි හැඳින්වූහ.

**මී පැණිවල ඇති ඖෂධීය ගුණය බටහිර ජාතිකයන්ගෙන් පළවු වෙන් ම සොයා ගත්තේ රෝමන්වරු ය. රෝමවරු බ්‍රිතාන්‍යය ආක්‍රමණය කළ පසු ඔවුන් මී පැණිවලට තද ඇල්මක් දැක්වූහ. සැම කෙනකු ම වාගේ මී පැණි විශාල වශයෙන් ආහාරයට ගත්හ. ඔවුහු නිරෝගීව දිගු කලක් ජීවත් වූහ. මේ නිසා ඔවුහු බ්‍රිතාන්‍යයට "මී පැණි දූපත"යැයි හැඳින්වූහ.**

හෘදය රෝගවලට මී පැණි වටිනා ඖෂධයක් යැයි ජර්මන් වෛද්‍ය විශේෂඥයකු වන ඊ. කොච් කියයි. ඔහු හෘද රෝගීන් සඳහා දෙන ප්‍රධාන ම ඖෂධය ද මී පැණි ය.

බ්‍රිතාන්‍යයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයකු වන ඒ. පී. බෙන්ටල් තුවාල සඳහා මී පැණි යොදයි. එය වෙනත් ඖෂධවලට වඩා ඉක්මනින් තුවාල සනීප කරන බව බෙන්ටල් කියයි. නෝපෝක් සහ නොරිච් හි රෝහල් දෙකේ ම සේවය කරන බෙන්ටල් මී පැණිවල විටමින් රාශියක් අඩංගු බව ද කියයි. ප්‍රකට ගත්කතුවරයකු හා නාට්‍ය රචිකාවක් වන බාබරා කාට්ලන්ඩ් මී පැණි කුඩා දරුවනට දිව්‍ය පානයක් බව කියයි. දරුවනට අවශ්‍ය සැම විටමින් පදාර්ථයක් ම මී පැණිවල ඇතුළත්ව ඇතැයි කියන ඇ වැඩිහිටියනට ද එබඳුම තත්ත්වයකින් මී පැණි පිහිටවන බව සඳහන් කරයි.

ඩෙන්මාර්කයේ වෛද්‍ය විශේෂඥයකු වන ඔලාප් මාටෙන්සන් තදබල ලෙස සුරාවට ඇබ්බැහි වූවනට ද එයින් ඇතිවන දුර්විපාක මැඩ ගැනීමට මී පැණි උපකාරී වන බව කියයි. ඒ හැර සුරාවෙන් ඈත්වීමට අවශ්‍ය අයට පැය බාගයෙන් බාගයට මී පැණි අවුන්ස දෙක බැගින් දින කීපයක් ගැනීමෙන් එසේ කිරීමේ හැකියාව ලැබෙන බව ද කියයි.

ඇමෙරිකාවේ වෛද්‍ය කණ්ඩායමක් විසින් වොෂිංටන්හිදී කරන ලද පුළුල් පරීක්ෂණයක දී නියුමෝනියා, උණ සන්නිපාතය වැනි රෝග සඳහා මී පැණි හොඳ ඖෂධයක් බව හෙළිවී තිබේ.

ලෝක ප්‍රකට වයලීන වාදකයකු වන යෙහුදී මෙනුවින් වයලින වාදනයක් ඉදිරිපත් කිරීමට පෙර කිරි සමඟ මී පැණි පාවිච්චි කරයි. සංදර්ශනවල දී හැම වාදන අංකයක් අතරට ම හේ පුරුද්දක් ලෙස එසේ කරයි. විවේකයේ දී තේ සමග මී පැණි පාවිච්චි කරයි. ඔහු කිසිදක රෝගයකින් නොපෙළෙන බවත් ඔහුගේ කුසලතාවල මොනම හේතුවක් නිසාවත් මඳ හෝ වෙනස්කමක් දක්නට නැති බවත් කියති.

කුඩා දරුවනට සීනි වෙනුවට මී පැණි පාවිච්චි කිරීම ඉතා යෝග්‍ය බව බොහෝ වෛද්‍යවරු කියති. මේ මතය ම බාබරා කාට්ලන්ඩ් ද දරයි. කාඩ්ලන්ඩ් මහත්මිය මී පැණි පිළිබඳව දිගු කලක සිට නොයෙකුත් අන්දමින් පරීක්ෂණ හා අත්හද බැලීම් කළා ය. මෙයට හේතු වූයේ ඇගේ සැමියා ය.

යුද්ධයේ දී වැදුණු වෙඩි පහරකින් ඇගේ සැමියාගේ එක් පෙණහල්ලක් ඉවත් කරනු ලැබිණි. ඒ හැර ඔහුගේ හෘදය ද දුර්වලව තිබිණි. වසර දෙක තුනකට වඩා ඔහු ජීවත් නොවන බව වෛද්‍යවරු එකහෙළා කීහ. කාඩ්ලන්ඩ් මහත්මිය කළේ උදේ හවා ඔහුට මී පැණි දීමයි. මාස කීපයකින් ඔහු ගේ තත්ත්වය සතුටුදායක විය. තරුණ වියේ මිය යතැයි නිගමනය කළ හේ වසර 65 ක් ම ජීවත් විය. වෛද්‍යවරුන් අපේක්ෂා කළ පරිදි ඔහුට පෙනහළු හෝ හෘද රෝග නොවැළඳුනි.

**දෙල්තොට**

❑

**"ලෝක ප්‍රකට වයලීන වාදකයකු වන යෙහුදී මෙනුවින් වයලින වාදනයක් ඉදිරිපත් කිරීමට පෙර කිරි සමඟ මී පැණි පාවිච්චි කරයි. සංදර්ශනවල දී හැම වාදන අංකයක් අතරට ම හේ පුරුද්දක් ලෙස එසේ කරයි. විවේකයේ දී තේ සමග මී පැණි පාවිච්චි කරයි. ඔහු කිසිදාක රෝගයකින් නොපෙළෙන බවත් ඔහුගේ කුසලතාවල මොනම හේතුවක් නිසාවත් මඳ හෝ වෙනස්කමක් දක්නට නැති බවත් කියති."**

වත්මන් දිනමිණ ප්‍රධාන කර්තෘ දෙල්තොට චන්ද්‍රපාල මහතා මීට වසර 23 කට පෙර නවයුගය (1976 නොවැම්බර් 12 ද) කලාපයකට ලියන ලද මෙම ලිපිය කාලීන වැදගත්කම නිසා වත්මන් පරපුර වෙනුවෙන් යළි පළකරන ලෙස ඉල්ලමින් අප වෙත ලියා එවා ඇත්තේ නවයුගයේ පළවන හරවත් ලිපි එක් රැස් කිරීම විනෝදාංශයක් කරගත් අපේ පාඨකයකු වූ වත්තල කේ. ඩී. ඇම්. පැට්‍රිෂියා ජයවර්ධන මහත්මිය විසිනි.